3
00062

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන **2018/2019**

අවසාන පරීක්ෂණය - **2020**

**EPC2421/ESC2221/EPA2421 -** පූර්ව ළමාවියේ සමායෝගී වීමේ ගැටළු

කාලය - පැය තුනයි.(03)

---

දිනය - **2020.07.19** වේලාව - ප.ව.**01.30** - ප.ව.**04.30** දක්වා

---

**1** වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, **2** වන කොටසේ තෝරාගනු ලබන ඕනෑම ප්‍රශ්න තුනකට **(03)** ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. සමායෝගී ගැටළු යන යෙදුම පැහැදිලි කරන්න.

02. 'ඊඩිපස් සංකීර්ණය' යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

03. එරික් එරික්සන්ගේ න්‍යායට අනුව ළමයින් සමාජය පිළිබඳව අවිශ්වාසය ගොඩනගා ගන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

04. ළමා සංවර්ධනය කෙරෙහි ප්‍රචණ්ඩකාරී චර්යාවල විපාක තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ළමයින් තුළ ඇති අධික ලැජ්ජාශීලී බව අවම කර ගැනීමට සහය විය හැකි ආකාර තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න.

06. කරණ ආරෝපණ න්‍යායට අනුව ඔබ ළමයි ඉගෙනුම සඳහා පොළඹවන්නේ කෙසේදැයි දක්වන්න.

07. සමීප ඥාතීන් අහිමි ළමයින් කෙරෙහි ආයතනගත කිරීමෙහි ධනාත්මක බලපෑම් පැහැදිලි කරන්න.

08. චර්යා හැඩ ගැස්වීමේ පියවර ලැයිස්තුගත කරන්න.

(ලකුණු 5x 8 = 40)

## 2 වන කොටස

09. I. ළමයින්ගේ සමායෝගී දුෂ්කරතා වලට බලපාන පාසල ආශ්‍රිත සාධක පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. පළපුරුදු ගුරුවරයෙකු ලෙස ඔබ සමායෝගී දුෂ්කරතා දක්වන ළමයින් සමඟ කටයුතු කරන නව ගුරුවරයෙකුට උපදෙස් ලබා දෙන්නේ කෙසේ ද? (ලකුණු 10)

10. I. එරික් එරික්සන් විසින් ඉදිරිපත් කරන ලද මනෝ සමාජීය සංවර්ධනට අදාල පළමු අවධි තුන (03) සාරාංශ ගත කරන්න. (ලකුණු 10)

II. උක්ත සඳහන් මනෝ සමාජීය සංවර්ධන අවධීන්ගේ එක් අවධියක් තෝරාගෙන එම අවධියේ අර්බුදයක් ඇති වූ විට එය ළමයාගේ පෞරුෂ සංවර්ධනයට ඇති කරන සෘණාත්මක ප්‍රතිවිපාක පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. I. දැඩි පාලනයක් යටතේ දරුවන් හදා වඩා ගන්නා දෙමාපිය ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. එම දෙමාපිය ශෛලිය ළමා සංවර්ධනයට ඇති කරන ප්‍රතිවිපාක මොනවා ද? (ලකුණු 10)

12. I. සෙල්ලම් චිකිත්සාව යන්න ඔබගේ වචනයෙන් නිර්වචනය කරන්න. (ලකුණු 08)

II. සංවර්ධනය සහ සෙල්ලම් අතර අන්තර් සබඳතාව පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. I. නිරීක්ෂාත්මක ඉගෙනුම් න්‍යායේ මූලික අදහස උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. නිරීක්ෂණාත්මක ඉගෙනුමට අනුව ළමයින් හිතකර සහ අහිතකර චර්යා ඉගෙන ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

14. I. ධනාත්මක සහ සෘණාත්මක චර්යා සංවර්ධනයෙහි ලා රූපවාහිනියේ බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. ළමයින් කෙරෙහි වන රූපවාහිනියේ සෘණාත්මක බලපෑම් අවම කරන්නේ කෙසේ ද? (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.